# ශ්‍රේෂ්ඨ දාර්ශනිකයාණෝ

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක,
කැටකාලේ උපරතන හිමි

දර්ශනය පුළුල් ක්ෂේත්‍රයක පැතිර පවතින්නකි. බුද්ධිමය ගැටළු රාශියකටම එමඟින් පිළිතුරු ලැබී තිබේ. එය ආරම්භයේ සිටම විවිධ දෘෂ්ටිකෝණයනට හසුවෙමින් විවිධ අර්ථකථනයනට ඉලක්ක වෙමින් පවතී. කෙනෙක් මෙය ස්වභාව ධර්මය පිළිබඳව දැනීම වශයෙන් හැඳින්වූහ. තවෙකෙක් එය ආගම යයි කීය. නිදහස් චින්තනයේ ඵලය යයිද තවත් කෙනෙක් කීහ. එහි පරමාර්ථය මොක්ෂය ලැබීම බවත් මතයකි.

මෙවැනි නොයෙක් අර්ථකථන නිර්වචන ආදියට හසුවූ දර්ශනය අද ශාස්ත්‍රීය විෂයෙකි. දර්ශනය යනු නුවණින් දැකීම යයි කිවද එය එක් අංශයකට පමණක් සීමා කිරීම සුදුසු නොවේ. දක්නට ලැබෙන්නේ මසැසින් වුවද නැණැසින් වුවද දැකීම දර්ශනයමය. එහි වෙනස නම් මසැසින් දැකීම ඇස් ඇති කාට වුවද කළ හැකි නමුත් නැණැසින් දැකීම නුවණැත්තනට පමණක් සීමා වීමය. එසේම නැණැසින් දැකීම පුද්ගලයාගේ බුද්ධි මට්ටම අනුව වෙනස් වේ.

දැකීම නැණැසින් වුවද මසැසින් වුවද නිරවද්‍ය ලෙස දැක්කේ නම් එය යථාර්ථ දර්ශනයයි. දර්ශනයේ වැදගත් හරවත් අංශයත් එයමය. එහෙත් වැරදි ලෙස දක්නා ලැබුවද එයත් දර්ශනයකි. තරුවක් මැණිකක් ලෙස දුටු කල එය ද දැකීමක් යයි කිව හැකිය.

මෙහිදී අපට වැරදි දැකීම්වලින් ප්‍රයෝජනයක් නැත. ප්‍රයෝජනයක් වනුයේ යථාර්ථ දර්ශනයෙනි. එයද මසැසින් හා නැණැසින් යන ක්‍රම දෙකින්ම දැකිය යුතුය. එහි මසැසින් දැකීම '' දැක ගැනීම '' යනුවෙනුත් නැණැසින් දැකීම '' අවබෝධ කරගැනීම '' යනුවෙනුත් හැඳින්විය හැකිය. එහිදී දැක ගන්නා දේවල් අවබෝධ කර ගැනීමට හැකිය. අවබෝධ කර ගන්නා සෑම දෙයක්ම දැක ගන්නට ලැබෙන්නේ නැත.

සත්වයා ඇති වූද පටන් නොයෙක් දේවල් දක්නට ඇත. නොයෙක් පදර්ථයන් සොයා ගන්නා ලද්දේය. ඒ මසැසට හසුවන භෞතික වස්තූන්ය. සොයා ගැනීම පහසුවූ බැවින් ඒවා මුලින්ම සොයා ගත්තවුන් දර්ශනිකයන්, විද්‍යාඥයන් ලෙස හැඳින්වීමක් නොවිණි. ගින්දර, ආයුධ ආදිය සොයා ගැනීම මේ ගණයට අයත් වේ.

පසු කලෙකදී මිනිසාගේ ඥානයේ දියුණුවත් සමඟම විශේෂ පුද්ගලයන් විසින් සාමාන්‍ය ජනයාට නොපෙනෙන දේවල් දක්නා ලදි. '' දර්ශනය '' යන මාතෘකාවට යටත්කර ගෙන හඳරනු ලබන්නේ ඔවුන් විසින් දක්නා ලද දේය. ඒ දක්නා ලද දේද කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් ආධ්‍යාත්මික හා භෞතික වශයෙනි. එයින් භෞතික සොයා ගැනීම් නම් විද්‍යාවේ දියුණුවයි. එහිදී ද්‍රව්‍යයන්ගේ පැවැත්මෙහි යථාර්ථය වටහා ගෙන එම ද්‍රව්‍ය නොයෙක් අයුරින් වෙනස් කොට සකස් කොට ගෙන තිබේ. ඒ සඳහා එම ද්‍රව්‍යයන්හි යථාර්ථය සොයා ගත්තාහු දර්ශනිකයන් ලෙස හඳුන්වනු ලැබෙති.

දර්ශනයේ ආධ්‍යාත්මික පැත්ත නම් සිත හා එහි යථාර්ථය වටහා ගැනීමයි. මෙය ඉතාමත්ම දුෂ්කර කාර්‍යයෙකි. කෙතරම් දුෂ්කර වුවත් ජන සමාජයේ භාග්‍යයකට මෙන් දර්ශනිකයා එය සෙවීම ආරම්භ කළේ භෞතික යථාර්ථය සෙවීමට වඩා උනන්දුවකින්ය. භෞතික යථාර්ථය සෙවීමේ උනන්දුව ඇති වූයේ පසු කලෙකය. ආධ්‍යාත්මික යථාර්ථය සෙවීමේ ඵලයක් ලෙස දර්ශනික ලෝකයේ වැදගත්ම සන්ධිස්ථානය වූ බුදු දහම අවබෝධ කරමින් බුදු රජාණන් වහන්සේ මේ විශ්වයේ සමස්ත යථාර්ථයම සම්පූර්ණයෙන්ම වටහා ගත් සේක. එසේ යථාවබෝධය ලබාගත් උන්වහන්සේ සත්වයාගේ පැවැත්මත් පැවැත්මේ හේතුවත් නැවැත්මත් නැවැත්මේ හේතුවත් දුටුසේක. වටහා ගැනීමේ ඥානයක් ඇතියනටද මඟ පෙන්වා දුන්හ.

බුදු රජාණන් වහන්සේ විද්‍යාත්මක උපක්‍රම ගණිතක්‍රම ආදිය පිළිබඳව දැනුම ලබා සිටියේදැයි ප්‍රශ්නයකි. විචාර පූර්වකව බැලුවහොත් පෙනෙන්නේ විද්‍යාත්මක දියුණුව යනුවෙන් හැඳින් වෙන්නේ ලොව ඇති පදාර්ථයන්ගේ යම් යම් බලවේග හෙළිවී තිබීම පමණක් බවයි.

විදුලිය, ගුවන් විදුලිය, යන්ත්‍ර, රොකට්, චන්ද්‍රිකා හා විදුලි මොළ නම්වූ පරිගණක යන්ත්‍ර ආදී සෑම විද්‍යාත්මක භාණ්ඩයකම ඇත්තේ මිනිසා වටහාගත් අර්ථයන්ය. ඒ සෑම යන්ත්‍රයකම ඇති ක්‍රියාකාරිත්වයන් ලොව පැවැති දේවල්ය. විද්‍යාඥයන් කළේ ඒවා සොයා ගෙන ඒවාට ක්‍රියාත්මක වීම පහසුවන අන්දමේ උපකරණ කට්ටල සංග්‍රහ කිරීමක් පමණි. උදාහරණයක් ලෙස විදුලිය ගෙන බලමු. එය බොහෝ ද්‍රව්‍යයන්හි අඩු වැඩි වශයෙන් පවතින දෙයකි. ක්‍රියාකාරිත්වයන් ඇතිවන අවස්ථාවලදී විදුලිය නිකුත් වීමද සුළු ප්‍රමාණයේ සිට මහා පරිමාණය දක්වාම සිදුවේ.

අපට ඒවායින් වන ප්‍රයෝජනයට වඩා සිදුවන්නේ අනර්ථයන්මය. විදුලියෙහි යථාර්ථය වටහා ගත් මිනිසා අධික වශයෙන් විදුලිය නිකුත් කරන කම්බි විශාල ප්‍රමාණයක් එක්කොට වේගයෙන් විදුලිය නිකුත් කිරීමට උදව්වන චුම්බකයක් අසල වේගවත් චලනයක් සිදුකොට විශාල විදුලියක් ලබා ගැනීමට ක්‍රියාකළේය. එහිදී කාර්මිකයා යන්ත්‍රයක් සාද ක්‍රියාත්මක කිරීමෙන් කළේ විදුලිය නමැති පදාර්ථයට පහසුවෙන් හා ක්‍රමවත්ව ක්‍රියාත්මක වීමට අවශ්‍ය වාතාවරණයක් සැකසීම පමණි. විදුලිය ඔහුගේ නිර්මාණයක් නොව එය ලොව පැවතුනකි.

මැදිරියක් ආලෝකවත් කරගත්තෙක් එහි ඇති සියල්ලක්ම දක්නාසේ යථාර්ථය නමැති මැදිරිය ඥානාලෝකයෙන් ආලෝකවත් කරගත් බුදුරජාණන් වහන්සේ මේ සියල්ලක්ම දැකගන්නට ඇත. එහෙත් එම කරුණු නිවන ලබාගැනීමට හේතු නොවන බැවින් යථාර්ථයට අයත් අනිත් කොටස් ලොවට අනාවරණය නොකළහ.

කොසඹෑනුවර ඇට්ටේරිය වනයෙහි වසන කල්හි දිනක් බුදුන් වහන්සේ ඇට්ටේරිය කොළ මිටක් තමන් වහන්සේගේ අතට ගෙන තමන් අවබෝධ කොටගත් ප්‍රමාණය මේ මහා වනයට සමාන කළහොත් ලොවට පෙන්වා වදාළ ප්‍රමාණය අතටගත් කොළ මිටට සමාන කළ හැකි බව දේශනා කළ සේක.

මේ අනුව අපට පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ ලොව දර්ශනිකයන් සෙවීමට වෑයම් කළ සියල්ලක්ම සොයා ගත් බවයි. අන්‍ය දර්ශනිකයන් කරන්නේ බුදු රදුන් නොවදළ කොටස් සොයා ගැනීමයි. එය අඳුරුව ඇති යථාර්ථය නමැති මැදිරියෙහි ගිනි පෙනෙලි වැනීමක් බඳුය. ඔවුන් දක්නේ සුළු ප්‍රමාණයක් වුවත් ඔවුන්ගේ අදහස වනුයේ එයම ලොව පූර්ණ යථාර්ථය බවයි.

එසේ සිතා ආලෝකයෙන් දිලිසෙන වීදුරු කටු ගෙන තමාද අනතුරු කොට ගෙන අන්‍යයන්ද අනතුරට දැමීම සිදු කරති.

තාක්ෂණික විද්‍යාත්මක ක්‍රම ආදිය සොයා නා නා භාණ්ඩ තනා ලොව තුල තව තවත් ලෝභය පතුරුවති. සියල්ලෝම ඒවායෙහි සිත් අලවා ලෝභයෙන් මෝහයට වැටී අන්ධයන් බවට පත් වෙති.

දර්ශනය වශයෙන් දත යුත්තේ ලොව මෙතෙක් නොදත් යථාර්ථයන් දැකීමය. එය දකින්නා දර්ශනිකයාය. මේ අනුව ලොව ශ්‍රේෂ්ඨම යථාර්ථවේදියාණෝ බුදුරජාණන්වහන්සේ බව පැහැදිලිය.

---

" යමෙක් සියල්ල දත් පුද්ගලයාගේ පාදය නොවැන්දේ නම් ඔහු ලබන ඉගෙනීමෙන් ප්‍රයෝජනයක් නැත."

*" கற்றதனாலாய பயனென்கொல் வாலறிவன் நற்றாள் தொழாஅர் எனின்*

— திருக்குறள் —